www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

ඕස්ට්‍රේලියානු සසපයට ඩේවිඩ් නෝර්ත් ගෙන් සුභ පැතුම්:

# "අපරාජිත ඇමරිකාව පිලිබඳ මිථ්‍යාවට විනාශකාරී ප්‍රහාරයක්"

## *Greetings from David North to Australian SEP:* "A devastating blow to the myth of American invincibility"

**2004 අප්‍රේල් 12**

*මෙහි පහත දැක්වෙන්නේ අප්‍රේල් 10-11 පැවැත්වුනු ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජික රැස්වීමකට ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සභාපතිවූ ද, එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ලේකම් වූ ද ඩේවිඩ් නෝර්ත් විසින් යවන ලද සුභ පැතුම් ලිපියකි.*

ආදරනීය සහෝදරවරුනි,

මෙම සති අන්තයේ සිඩ්නි නගරයේදී පැවැත්වෙන ඔබගේ රැස්වීම ආරම්භ කරද්දී ඇමරිකා එක්සත් ජනපදයේ ඔබගේ සහෝදරවරුන් හා සමචින්තකයන් විසින් එවනු ලබන මෙම සාතිශය උනුසුම් සුබපැතුම් පිලිගනු මැනවි.

ඓතිහාසික ක්‍රියාවලියේ යෝධතම සාධකය වන්නේ පීඩිත ජනතාවගේ අරගලය ය යන මාක්ස්වාදයේ සාරභූත ප්‍රස්තුතය බලගතු ලෙස සනාථවීමක් ලෙස ගතවූ සතියේ සිද්ධීහු පවතිත්. බැග්ඩෑඩ් නගරයට ඇතුලුවී අවුරුද්දක් ගතවන දිනයේ ඇමරිකානු යුද හමුදා, ඉරාක ජනතාවගේ සන්නද්ධ නැගිටීමකට මුහුන දී, සෑම අතින්ම වටලනු ලැබ සිටිති. සටනේ මෙම අවධියේ දී ඇතිවීමට යන ප්‍රතිඵලය කුමක් වුවද ඇමරිකානු අපරාජිතභාවයේ මිථ්‍යාව කුඩුපට්ටම් වී පවතී. වඩාත් සංයුක්තව කිව හොත්, ඉරාකය, ඇමරිකා එක්සත් ජනපදයේ යටත් විජිත වැයික්කියක් බවට පත්කරගැනීම සඳහා වූ බුෂ් පරිපාලනයේ මුලෝපායට විනාශකාරී ප්‍රහාරයක් මෙම සන්නද්ධ නැගිටීම මගින් එල්ල කොට ඇත.

වොෂිංටනයේ මූලික උපකල්පනයක් වී ඇත්තේ සුන්නි සහ ෂියා මුස්ලිම් ප්‍රජාවන් අතර භේදය පාවිච්චි කර ගනිමින්, ඒ කන්ඩායම් දෙකටම ඇමරිකානු ආධිපත්‍යයට සාර්ථකව ප්‍රතිරෝධය දැක්විය නොහැකි තත්වයක් ඇතිකරගත හැකිය යන්න යි. එපමනක් නොව, අයතුල්ලා අලි-සිස්තානි වටා වූ ප්‍රභූ කුඩා ස්ථරයක් සමග ඇතිකරගනු ලැබූ සම්මුතියක් මගින්ම ෂියා ප්‍රජාව තුල ගැබ්ව පැවැත්නාවූ විභව විරෝධය අකර්මන්‍ය කර දැමිය හැකි යයි ද එක්සත් ජනපදය විශ්වාස කලේ ය. සති දෙකකට පෙර එල් පෝල් බ්‍රෙමර් මහතා, මොක්ටාඩා අල් සද්ර් සමඟ ගැටුමක් අවුලුවා ගැනීමට උත්සාහ කරන කල්හි ඔහු විශ්වාස සහගත වූයේ මෙම තරුන පූජකයා වටාවූ ව්‍යාපාරය කුඩුකර දැමීම සාපේක්ෂකව පහසු වනු ඇතැයි කියාය.

අල්-සද්ර් ආරක්ෂා කිරීම සඳහා ඉබේටම පැන නැගි ජන නැගිටීම මගින් බ්‍රෙමර්ව මුලුමනින්ම මවිතයට පත් කෙරුනි. එය බුෂ් පාලනාධිකාරයේ රටවල් අල්ලාගැනීමේ මූලෝපායේ දේශපාලන බංකොලොත්කම එලිදරව් කලා පමනක් නොව, ඔවුන්ගේ මිලිටරි මහිමයේ බිඳෙන සුලු බවද ප්‍රදර්ශනය කලේ ය. වර්තමාන තත්වය පිලිබඳව ඊයේ (අප්‍රේල් 11) *ස්ට්‍රැට්ෆෝර්* නම් වෙබ් අඩවිය අනතුරු ඇඟවූ පරිදි:

"වර්තමාන ප්‍රවනතාවයන් වැඩි දියුනු වුවහොත් විනාශයට මඟ පෑදිය හැකි ප්‍රමුඛ මිලිටරි අභියෝගයකට ඇමරිකා එක්සත් ජනපදය මුහුන දී සිටී. පෘථුල පදනමකින් යුතු ෂියා නැගිටීමක් ද සුන්නි කැරැල්ලක් ද යන දෙකම මැඩ පැවැත්වීමට අවශ්‍ය හමුදා භටයන් එක්සත් ජනපදයට නැත. මෙම නැගිටීමේ වත්මන් භූමි ව්‍යාප්තිය, දැනට යොදවා සිටින හමුදාවන් ද ප්‍රායෝගික වශයෙන් ඉදිරියේදී යොදවාගත හැකි හමුදාවන් ද, ඉක්මවා සිටී. එක්සත් ජනපදය දැනටම සමහර නගරවලින් ඉවත් වෙමින් සිටී. මේ සියල්ලේ තාර්කික විපාකය වනු ඇත්තේ කුඩා වැයික්කිවලට කොටුවී සිටීමේ මුලෝපායකි. මෙහිදී, රටේ වැඩිහරියක් ගරිල්ලා හමුදාවලට අතහැරෙන අතර, එක්සත් ජනපදයේ හමුදාවන් - ඉරාක ජාතිකයන්ට ඇතුලුවීමට තහනම් වන බලකොටු ප්‍රදේශ ගනනාවක හිරවී සිටින තත්වයක් උද්ගත වනු ඇත. එවිට, ඇමරිකානු හමුදාවන්ට රට තුල හෝ රටේ සීමාවන්ගෙන් පිටත සාර්ථක බලයක් යෙදැවිය නොහැකි හෙයින්, එක්සත් ජනපද හමුදාවන් ඉරාකයේ රැඳී සිටීමට කරදර වන්නේ මන්ද යන ප්‍රශ්නයම, තිසැකව, උද්ගත කරනු ඇත."

ඉරාකය ආක්‍රමනය කොට අල්ලා ගැනීම සඳහා තම කීර්තියෙන් මෙතරම් පංගුවක් දැනටමත් පරදුවට තබා ඇති ඇමරිකානු අධිරාජ්‍යවාදය මෙම නැගිටීම මර්දනය කිරීම සඳහා සෑම ආකාරයකම ම්ලේච්ඡ ක්‍රම

යෙදවීමෙන් වලකිනු නැත. සත්තකින්ම, ඇමරිකානු සකල දේශපාලන සංස්ථාපිතයටම ඇමරිකානු හමුදා ඉරාකයෙන් ඉවත් කර ගැනීම ගැන සිතන්නටවත් බැරි ය. ඩිමොක්‍රැටික් පක්ෂය බුෂ් පාලනාධිකාරය කෙරේ දක්වන ප්‍රධාන විවේචනය නම්, බුෂ් පාලනාධිකාරය ඉරාකය මැඩ පැවැත්වීම සඳහා ඇතිතරම් හමුදා බලය යොදා නැති බවය. කෙසේ වෙතත් ඇමරිකානු පාලක පන්තියේ ඒත්තුගැන්වීම නොතකාම, ඉරාකයේ සිදුවීම් - *වෝල් ස්ට්‍රීට් ජර්නලයේ* වචන පාවිච්චි කරන්නේ නම් - "බලය වැඩ කරයි" යන ඉදිරි දර්ශනයේ සීමාවන් යසරඟට විදහා දක්වා ඇත.

අධිරාජ්‍යවාදී ආක්‍රමනිකයන්ට එරෙහිව, ඉරාක මහජනතාව යෙදී සිටින්නාවූ විරෝදාර අරගලය, ජාත්‍යන්තර කම්කරු පන්තියේ සහාය ලැබීමට හා අවංක ගෞරවයට පාත්‍ර වීමට උචිත වේ. ඉහවහයන අවාසිවලට මුහුනදී ඉරාක ජනතාව යෙදී ගෙන සිටින්නාවූ අරගලය අප ගෞරවයට පාත්‍රවන අතරතුරේම අධිරාජ්‍යවාදය පරාජයට පත්කල හැකි එකම බලවේගය වන කම්කරු පන්තියේ දේශපාලන නායකත්වය පිලිබඳ මූලික ගැටලු විසඳී නැතිබව ගැන අපට අන්ධ විය නොහැකි ය. අධිරාජ්‍යවාදයේ පරාජය රැඳී ඇත්තේ එය විසඳාලීම මතය. ජාත්‍යන්තර කමිටුවේද *ලෝක සමාජවාදී වෙබ් අඩවියේද* ඉමහත් ඓතිහාසික අර්ථභාරය පවත්නේ මෙහිය.

අල්-සද්ර් විසින් එක්සත් ජනපදයේ ජනතාවට කර ඇති ආයාචනයට අපි බරපතල ලෙස අවධානය යොමු කර සිටිමු. ඉරාක ජනතාව තුල, ඇමරිකානු අධිරාජ්‍යවාදය වනාහී එක්සන බලයක් නොවන බවද, ඇමරිකා එක්සත් ජනපදය අභ්‍යන්තර බෙදීම්වලින් ඉරීගොස් ඇති බවද පිලිබඳ නව වැටැහීමක් මෙම ආයාචනය විසින් පිලිබිඹු කරනු ලබයි. ඉරාක ජනතාව තමන්ගේ දේශසීමාවෙන් ඔබ්බෙහි ආධාර සෙවිය යුතු ය යන වැටහීමද මින් පිලිබිඹු වේ. විඥානයේ මෙම වර්ධනය පෙබරවාරි 2003, යුද විරෝධී පෙලපාලි තුලින් ඒ වනවිටත් අපේක්ෂනය කරන ලදි. මෙය, සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය ගොඩ නැගීම සඳහා, නව්‍ය හා වඩා වාසි සහගත තත්වයන් උදාවීම පිලිබඳ නවතම සනාථනයක් වේ.

ස්ටැලින්වාදී නිලධරයේ දශක ගනනාවක පාවාදීම්වල ප්‍රතිඵලයක් ලෙස සෝවියට් සංගමය බිඳවැටීම සමග, ඇමරිකානු අධිරාජ්‍යවාදය ඒත්තු ගත්තේ, තමාට කොයියම්ම ආකාරයකින් හෝ 20 වන ශත වර්ෂයේ සමස්ත සමාජ-දේශපාලන උරුමය සහ ඓතිහාසික වාර්තාව අකාමකා දැමිය හැකිය කියා ය. 21 වන සියවස, නව හා අනභිබවනීය ඇමරිකානු අධිරාජ්‍යවාදයක විජයග්‍රහනය දැකගනු ඇතැයි එය අපේක්ෂා කලේය.

ඒ වෙනුවට දැන් අධිරාජ්‍යවාදය දැකගනිමින් සිටින්නේ, කම්කරු පන්තියේ නව විප්ලවවාදී ව්‍යාපාරයක පැනනැගීමේ ප්‍රථම-තම අවධීන් වේ. ලෝක අධිරාජ්‍ය පද්ධතියේ නො විසඳිය හැකි ආර්ථික, දේශපාලන සහ සමාජ ප්‍රතිඝතිතාවන් විසින් වෛශයිකව ධාවනය කරනු ලබන මෙම ව්‍යාපාරයේ ඉරනම, පසුගිය ශතවර්ෂයේ ඓතිහාසික අරගලයන්ගේ පාඩම් උකහාගැනීම මත අවියෝජනීයව රැඳී පවතී. මෙම පාඩම් කම්කරු පන්තියට උකහාගත හැකි කරන්නේ අපගේ පක්ෂයම විසින් පමනි. අපගේ ජාත්‍යන්තර ව්‍යාපාරයේ වැඩකටයුතුවල අති මූලික වැදගත්කම පිලිබඳ අපට ඇති වැටහීමේ පදනම වන්නේ මේ පිලිබඳව අපට ඇති දැනුවත්කම ය.

උනුසුම් සුභ පැතුම් සහිතව,

ඩේවිඩ් නෝර්ත්,

එක්සත් ජනපද සසප දේශපාලන කමිටුව වෙනුවෙන්.

© www.wsws.org